# 1.17 ශ්‍රී ලංකාවේ ආදිවාසී සංගීතයේ නව ප්‍රවණතා පිළිබඳ අධ්‍යයනයක් (දඹාන ග්‍රාමය ආශ්‍රයෙන්)

පී.එච්.එස්. දේශප්‍රිය
476/1, ශාන්ත අන්තෝනිමාවත, නිට්ටඹුව.

## ABSTRACT

ශ්‍රී ලංකාවේ ආදිවාසීන් හෙවත් වැදි ජනයාගේ සංගීතයෙහි නව ප්‍රවණතාවන් පිළිබඳ අධ්‍යයනයෙන් අනාවරණය කරගත් කරුණු කිහිපයක් මතු කොට දැක්වීම මෙම පර්යේෂණ පත්‍රිකාවේ අරමුණ යි. ශ්‍රී ලංකාවේ ආදීවාසීන් හෙවත් වැදි ජනතාවගේ සංගීතය සියවස් පහකටත් අඩු කාල පරාසයක් තුළ විකාශනය වූවක් ලෙස සැලකිය හැකි අතර එම සංගීතය යකුන් උදෙසා කරන යාතුකර්මීය ගායනාවන් හෙවත් යැදීම උදෙසා කරන ගායනාවන් හා දෛනික ජීවිතයේ ක්‍රියාකාරකම් හා බද්ධ වු ගායනාවන් ලෙස වර්ග කළ හැකි ය. සීමා සහිත වූ නාදමාලාවන් කිහිපයක් පමණක් දක්නට ලැබීමත්, පටු ස්වර පරාසයක ව්‍යාප්ත වූ ගායනයත්, බෙරය හැරුණු කොට වාද්‍ය භාණ්ඩ භාවිතයෙන් තොර වීමත් ආදිවාසීන්ගේ සංගීතය ප්‍රාථමික සංගීතයක් ලෙස හැඳින්වීමට හේතු සාධක වී ඇත.

වර්තමානයේ දී කාලීන අවශ්‍යතාවන් අනුව ආදිවාසීන්ගේ සංගීතයෙහි නව ප්‍රවණතාවන් කිහිපයක් හඳුනාගැනීමට හැකිය. ඒ අතර ගීත සාහිත්‍ය, නාදමාලාවන් සහ සංගීත භාණ්ඩ පිළිබඳ වැඩි අවධානය යොමු කර ඇති බව පෙනේ. ගීත සාහිත්‍ය පිළිබඳ අධ්‍යයනයේ දී අභිචාර අර්ථය සහිත ගායනාවන් මෙන්ම දරුනැළවීම, දඩයම, වැනි දෛනික ජීවිතයේ අවස්ථාවන් මෙන් ම ආදරය, ළමා හැඟීම් ආදිය මෙම ගීතයන් හී අන්තර්ගතය. පැරණි වැදි ගී බහුතරයක සිංහල වචන මිශ්‍ර වූ ස්වභාවයක් හඳුනාගත හැකි වුවත් නව ගීත රචනයේ දී වැදි භාෂාව ම භාවිත කිරීමෙන් තම අනන්‍යතාව රැකගැනීමට උත්සුක වී ඇති බව ද පෙනේ. මෙම ගීතයන් හී නාදමාලාවන් සාම්ප්‍රදායික ශාන්තිකර්ම තනු හා බෙරපද මෙන් ම සාම්ප්‍රදායික නැළවිලි ගීත, දඩයම් ගීත, ආදර ගීතයන්හී නාදමාලාවන් ආභාසයෙන් නිර්මාණය කර ඇති බව පෙනේ. එමෙන් ම බෙරයේ රිද්ම ප්‍රකාශනය අනුව කරනු ලබන සාම්ප්‍රදායික වැදි ගීතය වඩාත් ආකර්ෂණීයව සහ නව්‍ය ස්වරූපයකින් යුතුව ඉදිරිපත් කිරීම සඳහා විවිධ සංගීතමය හඬක් ලබාගත හැකි උපකරණ ඔවුන් විසින් නිර්මාණය කර ඇති බව පෙනේ. ආදිවාසීන්ගේ සංගීතයේ විකාශනය පිළිබඳ අධ්‍යයනයේ දී මෙම අත්හදා බැලීම් ඔවුන්ගේ සංගීතයේ නව ප්‍රවණතා ලෙස සැලකිය හැකි ය. මෙම පර්යේෂණ පත්‍රිකාවේ දි වැදි ගීත සාහිත්‍ය, නාදමාලාවන් සහ සංගීත භාණ්ඩ පිළිබඳ වැඩි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ ආදිවාසීන් හෙවත් වැදි ජනයාගේ සංගීතයෙහි නව ප්‍රවණතාවන් පිළිබඳ කරුණු විග්‍රහ කිරීමට අපේක්ෂිතය.